**සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා**
**චක්‍රලේඛ ලිපි අංක - 12/2026**

මගේ අංකය :- PPSC/ES/09/FI/04/NUR/03-P.H.2
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
සබරගමුව පළාත් සභා සංකීර්ණය
නව නගරය ,රත්නපුර.
2026.05. 07

01. ලේකම් , ප්‍රධාන අමාත්‍යාංශය , සබරගමුව පළාත.
02. පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ , සබරගමුව පළාත.
03. ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ , රත්නපුර/කෑගල්ල

**හෙද ආචාරිණී (මහජන සෞඛ්‍ය) විශේෂ ශ්‍රේණියට උසස් කිරීම**

හෙද සේවාවේ අධි ශ්‍රේණියේ හෙද නිලධාරී (මහජන සෞඛ්‍ය) හා I වන ශ්‍රේණියේ හෙද නිලධාරී (මහජන සෞඛ්‍ය) තනතුරේ සිට හෙද ආචාරිණී (මහජන සෞඛ්‍ය) විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා සබරගමුව පළාත් සභාව යටතේ ඇති ආයතනවල සේවයේ නියුතු පහත සුදුසුකම් සපුරාලන අධි ශ්‍රේණියේ හෙද නිලධාරී (මහජන සෞඛ්‍ය) හා I වන ශ්‍රේණියේ හෙද නිලධාරී (මහජන සෞඛ්‍ය) තනතුරේ සිටින නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. **පශ්චාත් ප්‍රාථමික හෙද පුහුණුවෙන් පසු I ශ්‍රේණියට උසස්වීම් ලබා ඇති අධි සේවක පදනම මත I ශ්‍රේණියට උසස් වූ හෙද නිලධාරීන් හට ද මෙම විශේෂ ශ්‍රේණියේ පුරප්පාඩු සඳහා ඉල්ලුම් කිරීමේ හැකියාව පවතී.**

**02. අයදුම්කරුවන් විසින් සපුරා තිබිය යුතු සුදුසුකම්**

I. ජාතික හෙද අධ්‍යාපන ආයතනය/පශ්චාත් ප්‍රාථමික හෙද විදුහල විසින් පවත්වනු ලබන මහජන සෞඛ්‍ය හෙදකම හා වින්නඹු කර්මය අඩංගු අවුරුදු 1 ½ ක ඩිප්ලෝමා පාඨමාලාව හදාරා, අධි ශ්‍රේණියේ හෙද නිලධාරී (මහජන සෞඛ්‍ය) තනතුරක හෝ I වන ශ්‍රේණියේ හෙද නිලධාරී (මහජන සෞඛ්‍ය) තනතුරක හෝ එම තනතුරු දෙකෙහිම හෝ වසර පහක (05) සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

II. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම.

III. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් නියමිත දිනට පූර්වාසන්න වසර 05 තුළ නියමිත වැටුප් වර්ධක සියල්ල උපයාගෙන තිබීම සහ අදාළ කාලය තුළ සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

IV. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර පහ (05) තුළ සතුටුදායක මට්ටම හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

V. හෙද ආචාරිණියක ලෙස ජාතික සෞඛ්‍ය විද්‍යායතනය මඟින් ලබා දෙන මාස 06ක පුහුණුව සම්පූර්ණ කර තිබීම.

**03. අයදුම් කළ යුතු පිළිවෙළ :**

මෙම නිවේදනයේ අවසානයට දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව අයදුම්පත් පිළියෙල කර ගෙන එය තම අත් අකුරින් පැහැදිළිව සම්පූර්ණ කර පහත පරිදි ක්‍රියා කළ යුතුය.

I. අයදුම්කරුවන් තම අයදුම්පත තමා සේවය කරන ආයතන ප්‍රධානියා වෙත ඉදිරිපත් කළ යුතුය. ආයතන ප්‍රධානියා විසින් තමාට ලැබෙන අයදුම්පත්හි නියමිත ස්ථානයේ තම නිර්දේශය සඳහන් කර අදාළ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත වහාම ඉදිරිපත් කළ යුතුය.

II. ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන් (පෞද්ගලික ලිපිගොනු නඩත්තු කරන ) අයදුම්පත්හි දක්වා ඇති තොරතුරු පෞද්ගලික ලිපිගොනුවල වාර්තා සටහන් හා සසඳා බලා එම තොරතුරුවල නිරවද්‍යතාවය සහතික කර උපලේඛනගත කර (නියමිත සුදුසුකම් ඇති අය සහ නැති අය වශයෙන් වර්ග කර) පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත එවිය යුතුය.

III. පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් තමන්ට ලැබෙන සියලුම අයදුම්පත් නිවැරදිව උපලේඛනගත කර (නියමිත සුදුසුකම් ඇති අය සහ නැති අය වශයෙන් වර්ග කර) යෝග්‍යතාවය අනුපිළිවෙලට පෙළගස්වා ප්‍රධාන අමාත්‍යාංශයේ ලේකම්ගේ හා ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය සහිතව **2026.06.08.** දින හෝ ඊට පෙර ලැබෙන සේ මා වෙත එවිය යුතුය. කිසිදු හේතුවක් නිසාවත් නිලධරයෙකු විසින් ආයතන ප්‍රධානියාගේ නිර්දේශ රහිතව හෝ ආවරණ ලිපියක් රහිතව ඉදිරිපත් කරන අයදුම්පත් භාරගනු නොලැබේ. මෙම නිවේදනයට පරිබාහිරව ඉදිරිපත් කරන සෑම අයදුම්පතක්ම දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ

**04.** **තෝරා ගැනීමේ ක්‍රමවේදය**

I. මෙම කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් පවත්වා සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව අනුව හෙද ආචාරිණී (මහජන සෞඛ්‍ය) විශේෂ ශ්‍රේණියට උසස් කිරීම පත්වීම් බලධාරියා විසින් සිදු කරනු ලැබේ.

II. හෙද ආචාරිණී (මහජන සෞඛ්‍ය ) විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා වන සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති බවට පිළිගනු ලබන්නේ අයදුම්කරු ඉහත 2 හි සඳහන් සුදුසුකම් **2025.12.31** දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබේ නම් පමණි. සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ සහතිකවල සහතික කළ පිටපත් අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතුය.

III. සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවිය යුතු අයදුම්කරුවන් සංඛ්‍යාව අවස්ථාවෝචිත පරිදි හා I වන ශ්‍රේණියේ හෙද නිලධාරී (මහජන සෞඛ්‍ය ) තනතුරට පත්වූ දිනය අනුව ජ්‍යෙෂ්ඨත්වය ද , හෙද සේවයේ I වන ශ්‍රේණියට පත් කිරීම සඳහා වන ජාතික හෙද අධ්‍යාපන ආයතනයේ / පශ්චාත් ප්‍රාථමික හෙද පුහුණුවේ අවසන් පරීක්ෂණයේ දී ඔවුන් විසින් ලබාගත් කුසලතා අනුපිළිවෙල ද අදාළ පුරප්පාඩු සංඛ්‍යාව ද අනුව පත් කිරීම් බලධාරියා විසින් තීරණය කරනු ලැබේ.

05. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව හෙද ආචාරිණී (මහජන සෞඛ්‍ය) විශේෂ ශ්‍රේණියට උසස් කිරීමට අදාළ වැටුප් ඛාණ්ඩය MT 08/2016 වේ.

06. විශේෂ ශ්‍රේණියේ හෙද ආචාරිණී (මහජන සෞඛ්‍ය) තනතුරෙහි පවතින පුරප්පාඩු සංඛ්‍යාව 01කි. සම්මුඛ පරීක්ෂණය සඳහා ඉදිරිපත් වන අයදුම්කරුවන් I වන ශ්‍රේණියේ හෙද නිලධාරී (මහජන සෞඛ්‍ය ) තනතුරට පත්වූ දිනය අනුව ජ්‍යෙෂ්ඨත්වය ද හෙද සේවයේ I වන ශ්‍රේණියට පත් කිරීම සඳහා වන ජාතික හෙද අධ්‍යාපන ආයතනයේ / පශ්චාත් ප්‍රාථමික හෙද පුහුණුවේ අවසන් පරීක්ෂණයේ දී ඔවුන් විසින් ලබාගත් කුසලතා අනුපිළිවෙල ද සලකා උසස්වීම ලබා දීම සිදු කරනු ලබන අතර පුරප්පාඩුව පවතින රත්නපුර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට පත් කරනු ලැබේ.

07. හෙද ආචාරිණී (මහජන සෞඛ්‍ය) විශේෂ ශ්‍රේණියට උසස් කළ නිලධාරියෙකු රජයට අතිරේක වියදමක් නොවන අයුරින් කෙටි දැන්වීමකින් පත්වීම භාරගත යුතු අතර එසේ තනතුරට පත් කිරීමෙන් පසු සති දෙකක් තුළ අදාළ තනතුරේ සේවය සඳහා වාර්තා නොකළහොත් අදාළ නිලධරයාගේ උසස්වීම අවලංගු වේ.

**08. ඉහත කොන්දේසි යටතේ උසස්වීම ලබා ගැනීමට එකඟවන නිලධාරීන් පමණක් අදාළ ආයතන ප්‍රධානීන් මඟින් අයදුම් කළ යුතුය.**

09. තවද මෙම නිවේදනය මඟින් ආවරණය නොවන යම් කරුණක් සම්බන්ධයෙන් සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසන් තීරණය වනු ඇත.

10. මෙම චක්‍රලේඛය සබරගමුව පළාත් සභා වෙබ් අඩවියේ www.sg.gov.lk හා පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා වෙබ් අඩවියේ www.psc.sg.gov.lk පළකර ඇති අතර මෙම චක්‍රලේඛය ඔබ යටතේ ඇති ආයතනවල සේවය කරන සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ සියලුම I වන ශ්‍රේණියේ සහ අධි ශ්‍රේණියේ (මහජන සෞඛ්‍ය ) හෙද නිලධාරින්ගේ දැන ගැනීම සඳහා කඩිනමින් යොමු කරන මෙන් කාරුණිකව දන්වමි.

ඩබ්.ආර්.දිනිෂා එස්.රත්නායක
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත් සභාව.

ඩබ්.ආර්. දිනිෂා එස්. රත්නායක
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත

පිටපත : ප්‍රධාන ලේකම්, සබරගමුව පළාත. - කාරුණික දැන ගැනීම සඳහා